1. අවුරුදු 18ට අඩු ඕනෑම අයකුට මෙම අයිතීන් ඇත.

2. ඔබට වෙන්කොට සැලකීමෙන් ආරක්ෂාවීමට අයිතියක් ඇත. එනම් ළමයාගේ සමේ වර්ණය, ලිංගිකත්වය හෝ ආගම කථාකරන භාෂාව දුබලතාව, දුප්පත් පොහොසත් බව නිසා කිසිම කෙනෙකුට වෙන්කර සැලකිය නොහැක.

3. වැඩිහිටියන් සැමවිටම කල යුත්තේ ළමයාට වඩාත් සුදුසු දේය

4. ළමයාගේ අයිතීන් ලබාදීමට ආණ්ඩුවට වගකීමක් ඇත.

5. ළමයන්ට දෙමාපියන්ගෙන් හා තමාගේ පවුලේ මඟපෙන්වීම ලැබීමට අයිතියක් ඇත.

6. ළමයන්ට ජීවත්වීමට අයිතියක් ඇත.

7. ළමයන්ට නමක් සහ ජාතියක් තිබීමට අයිතියක් ඇත.

8. ළමයන්ට අනන්‍යතාවයක් ලැබීමට අයිතියක් ඇත.

9. ළමයන්ට තමන්ගේ දෙමාපියන් සමඟ ජීවත්වීමට අයිතියක් ඇත. නමුත් එය ළමයාට හානිදායක නොවිය යුතුය

10. ළමයාත් දෙමාපියනුත් රටවල් දෙකක ජීවත්වන්නේ නම් ඔබට ඔබගේ දෙමාපියන් හා එක්වීමට අයිතියක් ඇත.

11. ළමයාව පැහැර ගැනීමට කිසිම කෙනෙකුට අයිතියක් නැත

12. ළමයාට අදහස් ප්‍රකාශ කිරීමට අයිතියක් ඇති අතර එය වැදගත්බවට පිළිගැනීමක් ලැබීමට අයිතියක් ඇත.

13. ළමයාට චිත්‍ර කථා පැවැත්වීම ලිවීම ආදියෙන් විවිධ දේ දැනගැනීමටත් විවිධ දේ ප්‍රකාශ කිරීමටත් අයිතියක් ඇත.

14. දෙමාපියන්ගේ මඟපෙන්වීම යටතේ අවශ්‍ය දේ සිතීමටත් කැමති ආගමක් ඇදහීමටත් අයිතියක් ඇත.

15. අන් අයගේ අයිතීන් කඩ නොවේ නම් ඔබේ යහළුවන් සමඟ සිටීමටත්, සමිති සමාගම්වලට බැඳීමට හා ආරම්භ කිරීමට අයිතියක් ඇත.

16. පෞද්ගලිකත්වයට අයිතියක් ඇත. උදාහරණයක් ලෙස දින පොතක් පවත්වා ගැනීමටත් එය අන් අයට නොපෙන්වීමටත් අයිතියක් ඇත.

17. ළමයාට ගුවන්විදුලිය, පුවත්පත්, රූපවාහිනී ආදියෙන් තොරතුරු ලබාගැනීමට අයිතියක් ඇති අතර, හානිදායක තොරතුරු වලින් ආරක්ෂාවීමටත් අයිතියක් ඇත.

18. ළමයින්ට තමාගේ දෙමාපියන්ගේ මඟපෙන්වීම අනුව වර්ධනය වීමට අයිතියක් ඇත.

19. ළමයින්ට තුවාල කිරීමෙන් හා දරුණු ලෙස සැලකීමෙන් ආරක්ෂාවීමට අයිතියක් ඇත.

20. ළමයාගේ දෙමාපියන් සමඟ ජීවත්වීමට නොහැකි නම් ළමයාට විශේෂ රැකවරණය ලැබීමට අයිතියක් ඇත.

21. ළමයාව දරුකමට හදාගැනීමට ගෙන ඇත්නම් ළමයාට උපරිම ආරක්ෂාව ලැබීමට අයිතියක් ඇත.

22. ළමයා සරණාගතයෙක් නම් ඔබට විශේෂ රැකවරණය ලැබීමට අයිතියක් ඇත.

23. ළමයා මානසිකව හෝ ශාරීරිකව ආබාධිත නම් ළමයාට විශේෂ රැකවරණයක් හා අධ්‍යාපනයක් ලබා වර්ධනය වීමට අයිතියක් ඇත.

24. ළමයාට ලැබිය හැකි උසස්ම සෞඛ්‍යය පහසුකම් ලැබීමට, වෛද්‍ය පහසුකම් හා නිරෝගීව සිටීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට අයිතියක් ඇත.

25. ළමයා ගෙදරින් පිටව ජීවත් වන්නේ නම් එම ස්ථානයේ තත්වය නිතරම පරීක්ෂා කරවා ගැනීමට අයිතියක් ඇත.

26. ළමයා දුප්පත් නම් රජයෙන් උපකාර ලැබීමට ඔබට අයිතියක් ඇත.

27. ළමායට හොඳ ජීවන තත්වයක් ලැබීමට අයිතියක් ඇත. එනම් ඇඳුම්, ආහාර හා නිවාසයක් ලැබීමට අයිතියක් ඇත.

28. ළමයාට අධ්‍යාපනය ලැබීමට අයිතියක් ඇත.

29. ළමයාගේ පෞර්ෂත්වය හා හැකියාවන් වර්ධනය වන මෙන්ම ඔබට අන් අයගේ අයිතීන් හට ගරු කිරීමට පුරුදු කරන අධ්‍යාපනයක් ලැබීමට අයිතියක් ඇත.

30. ළමයාගේ ජාතිය, ආගම හෝ භාෂාව නිසා ළමයා සුළු ජන කොටසකට අයිති වේ නම් තමාගේ ආගම හා සංස්කෘතිය භුක්තිවිඳිමටත්, තම භාෂාව කතා කිරීමටත් අයිතියක් ඇත.

31. ක්‍රීඩා, සංගීතය හා නාට්‍ය වැනි දෑ තුලින් ළමයාට ක්‍රීඩා කිරීමට හා විවේක ගැනීමට අයිතියක් ඇත.

32. ළමයාගේ අධ්‍යාපනයට හෝ සෞඛ්‍යයට හානිදායක රැකියාවන්ගෙන් ආරක්ෂා වීමට අයිතියක් ඇත.

33. මත්ද්‍රව්‍යයන්ගෙන් ආරක්ෂාවීමට ළමයාට අයිතියක් ඇත.

34. ලිංගික අපයෝජනයෙන් ආරක්ෂා වීමට ළමයාට අයිතියක් ඇත.

35. ළමයාව පැහැර ගැනීමට හෝ විකිණීමට කිසිවෙකුට අයිතියක් නැත.

36. ළමයාව ඕනෑම ආකාරයේ සූරාකෑමකින් ආරක්ෂාවීමට අයිතියක් ඇත.

37. ළමයාට දරුණු හෝ හානිදායක දඩුවම් වලින් ආරක්ෂා වීමට අයිතියක් ඇත.

38. ළමයාට යුද්ධ පවතින කාලවලදී ආක්ෂාවීමට අයිතියක් ඇත. ළමයාගේ වයස අවුරුදු 15ට අඩු නම් කිසිම යුද්ධයකට හෝ හමුදාවකට යොදා ගැනීමට නොහැක.

39. ළමයාව නොසලකා හැර ඇත්නම් වේදනාවකට ලක් කර ඇත්නම් හෝ වැරදි ලෙස සලකා ඇත්නම් උදව් ලබා ගැනීමට අයිතියක් ඇත.

40. ළමයා නීති විරෝධී කටයුතු කර ඇති බවට චෝදනාවකට ලක් වී ඇත්නම් ළමයාට උසාවියට ඉදිරිපත් වීමට උදව් ලබා ගැනීමට අයිතියක් ඇත.

41. ළමයාගේ රටෙහි හෝ අන්තර් ජාතිකව මීට වඩා හොඳින් ළමයාව ආරක්ෂා වන අයිතීන් ඇත්නම් ඒවා ලැබීමට අයිතියක් ඇත.

42. සියළුම වැඩිහිටියන් හා දරුවන් මෙම ප්‍රඥප්තිය පිළිබඳ දැන ගත යුතුය. ළමයාට තමාගේ අයිතීන් පිළිබඳ දැන ගැනීමට අයිතියක් ඇති අතර වැඩිහිටියන්ද එවා දැන ගත යුතුය.

මෙම ප්‍රඥප්තියෙහි වගන්ති 54ක් ඇත. 43- 54 දක්වා වූ වගන්ති සියල්ලම රජය විසින් ප්‍රඥප්තිය පිළිබඳ පසු විපරම් කළ යුතු ආකාරය හා එය ක්‍රියාත්මක කළ යුතු ආකාරය විස්තර කරයි.